# බටහිර දර්ශනයේ අඳුරු යුගය

හෝමාගම ධම්මානන්ද හිමි

ඈත ග්‍රීක දර්ශනයේ අවසාන දාර්ශනිකයා ලෙස සැලකෙන ඇරිස්ටෝටල් ගෙන් පසු උදා වන්නේ, මධ්‍යතන දාර්ශනික අවධි යයි. ***ක්‍රි:ව: 400 සිට ක්‍රි:ව: 1400*** දක්වා වසර දහසක පමණ කාලයක් මධ්‍යතන අවධිය නියෝජනය කෙරේ.[1] මෙම අවධිය නියෝජනය කරන ප්‍රධාන දාර්ශනිකයන් ලෙස ශාන්ත ඔගස්ටීන් ***(ක්‍රි:ව:354-430),*** ශාන්ත ඇන්ස්ලම් ***(ක්‍රි:ව:1033-1109),*** සහ ශාන්ත තෝමස් ඇක්වයිනාස් ***(ක්‍රි:ව:1225-1275),*** හඳුන්වා දිය හැකිය. මධ්‍යතන දාර්ශනික අවධිය නියෝජනය කරන දාර්ශනිකයාගේ සහ දර්ශනයේ අරමුණ, ස්වභාවය, සහ කාර්යභාරය එකක් ම විය. එසේම එය අතිශයින් ම පටු ක්ෂේත්‍රයකට පමණක් සීමා විය. එනම් කිතු දහමත් දෙවියන් වහන්සේත් දර්ශන විෂයයේ ප්‍රධාන ප්‍රස්තුතය වීමයි. මේ නිසා ම මේ අවධිය තුළ සාකච්ඡා වූ දේ දාර්ශනික යැයි කීමට පවා කෙනෙක් මැලි වෙති.

තේල්ස්ගෙන් ආරම්භ වී ඇරිස්ටෝටල් ගෙන් නිමා වී ගිය ග්‍රීක දර්ශනයේ ප්‍රධාන ලක්ෂණය වූයේ සංශය වාදයයි. එහෙත් මෙහි සංශය නම් හුදු වාදයක් වූවා නොව නව දැනුමෙන් පිපාසිත වූවන්ට නව දැනුම ගවේෂණයෙහි මෙවලමක් වීමයි. ග්‍රීක චින්තනය තුළ විවිධත්වයෙන් යුතු දාර්ශනික සංකල්ප මෙන් ම එකිනෙක පරයන දාර්ශනික පද්ධති ගොඩනැගෙන්නේ, මේ සංශයවාදී නැඹුරුවේ ප්‍රතිඵලයක් වශයෙනි. එහෙත් මධ්‍යතන අවධිය ඉඩ හසර ලබා දුන්නේ, සංශයට නොව විශ්වාසයට සහ භක්තියටයි. "නිදහස් චින්තනයට කිසි ඉඩක් නොමැතිව පැවති මධ්‍යතන යුරෝපීය දර්ශනයෙහි සංශයවාදී අදහස් නොතිබිණ. කතෝලික පල්ලි සංස්ථාව, සංශයවාදී නවතම පිබිදීම, අදේව වාදය හා සලකා තිබූ හෙයින්, නව සංකල්පයන්ට ඉඩ ප්‍රස්තා නොතිබි බව පෙනේ."[2] පල්ලියේ සහ කිතු දහමේ අදහස් නියෝජනය නොකෙරෙන, ඒවාට අනුබල නොදෙන, කිසිවක් කථා නොකෙරුණු අවධියක් ලෙස මධ්‍යතන අවධිය සැලකීම වඩාත් යෝග්‍යය.

සියල්ල විශ්වාසය මත පදනම් වන, ආගමික චින්තනයක ආධිපත්‍ය පැතුරුණු "මධ්‍යතන යුරෝපීය දර්ශනය, බොහෝ විට විස්තර කර ඇත්තේ, කතෝලික දර්ශනය නමිනි. එයට ප්‍රධාන හේතුව



නම් එම දර්ශනය කතෝලික පල්ලි සංස්ථාවේ දර්ශනය වන බැවිනි."[3] දර්ශන විෂයය තමන්ගේ අවශ්‍යතාවයන් සඳහා මුළුමනින් ම යොදාගත් පල්ලිය එහි ආධිපත්‍ය සියතට ගෙන ප්‍රකාශ කර සිටියේ, දාර්ශනිකයාගේ මූලික කාර්ය භාරය විය යුත්තේ, 'කුමන හෝ මගෙකින් කිතු දහමේ එන අදහස් සහ ඉගැන්වීම් සමාජය තුළ ව්‍යාප්ත කිරීමත් ඒ කෙරෙහි අචල භක්තියක් මිනිසුන්ගේ හදවත් තුළ ජනිත කිරීමත්, එයට පටහැනි කිසිදු මතයකට ඉඩක් නොතැබිය යුතු බවත්ය.'[4] මේ සඳහා අවශ්‍ය මූලික අඩිතාලම ශාන්ත ඔගස්ටීන් විසින් යොදන ලදී. 'මේ දර්ශන වාදියාගේ දර්ශනයෙහි වැදගත් කියමනක් නම් 'තේරුම් ගැනීමට නම් විශ්වාස කරන්න' යන්නයි. මින් ගම්‍ය වනුයේ, දර්ශනය හැදෑරීමේදී ප්‍රයෝජනය වන්නේත්, එයට පදනම වන්නේත්, අපක්ෂපාත ලෙස ක්‍රියා කළ හැකි නිදහස් මනුෂ්‍ය බුද්ධිය නොව, ආධානග්‍රාහී භක්තිය හෙවත් විශ්වාසය හෙවත් ලබ්ධිය බවකි.'[5] බටහිර දර්ශන ඉතිහාසයේ අඳුරු අවධිය[6] ***(dark period)*** ලෙස මධ්‍යතන අවධිය හඳුන් වන්නේ, මේ ආධානග්‍රාහී පල්ලි සංස්ථාවේ බලපෑමෙන් මිදීමට කිසිදු අවකාශයක් හෝ ඉඩප්‍රස්ථාවක් මෙකල නොතිබුණු බැවිනි.

මිනිසුන් දැඩි උත්සාහයකින් සොයන, ගවේෂණය කරන සත්‍ය, යථාර්ථය, දැනගත යුතු සියල්ල, දෙවියන් වහන්සේ විසින් ප්‍රකාශ කර ඇත. "මධ්‍යකාලීන දර්ශනය ඔප්නැංවූ දාර්ශනිකයන් වන ඔගස්ටින්, ඇම්බ්‍රෝස්, වික්ටෝරිනස්, බෝතියස්, යනාදීහු සත්‍ය ලෝකය වශයෙන් පිළිගනු ලැබුයේ ඉන්ද්‍රිය ගෝචර ලෝකය නොව සදාකාලික බවයි. සත්‍ය වනාහී දෙවියන්ය."[7] එනම් ශුද්ධ වූ දේව වාක්‍යයන්ය. ඒවායෙහි අඩුපාඩුකම් නැත. එම නිසා ඒවා ප්‍රශ්න කළ යුතු නොවේ. කළ යුතු වන්නේ, විශ්වාසයෙන් පිළිගැනීමයි.[8] "තවද සත්‍යයන් සර්වබලධාරී දෙවියන් වහන්සේ කෙනෙකුන්ගේ දේව වාක්‍යයන් බැවින්, ඒවා ගැන ප්‍රශ්න කිරීමට ද මනුෂ්‍ය බුද්ධියට හැකියාවක් නොමැත. මනුෂ්‍යයාත් ඔහුගේ බුද්ධියත් අනියත ස්වභාවයක් උසුලන හෙයිනි. අනියත මනුෂ්‍යයා වෙත නියත ***(absolute)*** පරම සත්‍යය ප්‍රදානය කළ හැක්කේ, සර්වබලධාරී දෙවියන් වහන්සේට පමණි."[9] මක්නිසාද යත් සර්වබලධාරී දෙවියන්ට වැරදී යා නොහැකි බැවිනි. කිසියම් කෙනෙකු දේව වාක්‍ය සැකයට භාජනය කරයි නම් හෝ ප්‍රශ්න කරයි නම් එය බරපතල දඬුවම් පැමිණ විය යුතු වරදකි. මේ කුමන තහංචි, දඬුවම් පැනවුව ද නිදහස් මනසට එන නිදහස් අදහස් වලට වැට කඩොලු

බැඳීමට කිසිවකුට නොහැකිය. තහංචි දමා දඬුවම් පනවා තිබුණ ද මෙකල ද නිදහස් අදහස් ප්‍රකාශ කළවුන් නැත්තේ ම නොවේ. එහෙත් එසේ නිදහස් අදහස් දැරූවන්ට අවසානයේ සිදු වූයේ ජීවිතයෙන් වන්දි ගෙවන්නටය.

කතෝලික පල්ලිය විසින් නිදහස් මත ධාරීන් අප්‍රමාණ සංඛ්‍යාවක් මරා දමන ලද්දේ, කතෝලික පල්ලියේ චින්තනය අභියෝගයට ලක් කිරීමේ වරද නිසාය. දර්ශන ඉතිහාසයේ අපට හමු වන "බෲනෝ" ඒ සඳහා එක් නිදසුනක් පමණි. "මධ්‍යතන යුරෝපීය සමයේදී සහ පුනරුත්ථානය ඇරඹි ශතවර්ෂයන්හි, ලක්ෂ සංඛ්‍යාත ජනකායක් කතෝලික පල්ලියේ 'සත්‍යය' අවිශ්වාස කිරීම නිසා හෝ ප්‍රශ්න කිරීම නිසා හෝ පුළුස්සා මරණ ලද බව මනුෂ්‍ය ඉතිහාසය නිහඬව පවසයි."[10]

මධ්‍යතන යුගය නියෝජනය කරන, අප ඉහතින් සඳහන් කළ දාර්ශනිකයන් තිදෙනා පල්ලියේ අවශ්‍යතාව මැනවින් ඉටු කිරීමට සැලකිය යුතු උත්සාහයක් ගෙන තිබේ. දෙවියන් වහන්සේගේ පැවැත්ම ***(excistence of God)*** සනාථ කළ හොත් පල්ලියේ ඉගැන්වීම් වලට ලැබෙන්නේ, අසීමිත වටිනාකමකි. එසේ ම ඒවා කිසිවකුගේ අභියෝගයට භාජනය වන්නේ ද නැත. එම නිසා මෙම දාර්ශනිකයන්ගේ මුඛ්‍ය පරමාර්ථය වූයේ, දෙවියන්ගේ පැවැත්ම විවිධ තර්ක උපයෝගී කරගෙන සනාථ කරීමයි. එසේද වුවත් මේ බොහෝ තර්කයන්ගේ මූල ධර්ම ප්ලේටෝගේ සහ ඇරිස්ටෝටල්ගේ මූලික ඉගැන්වීම් ආශ්‍රයෙන් ගොඩනඟා ගත් ඒවා බව මෙහිදී විශේෂයෙන් අවධාරණය කළ යුතුය. දෙවියන්ගේ පැවැත්ම සනාථ කිරීම සඳහා ප්‍රධාන තර්ක තුනක් ඉදිරිපත්වී ඇත. එනම්,

1. සත්භාව තර්කය ***(Ontological Argument)***
2. සාධ්‍යතා තර්කය ***(Teleological Argument)***
3. මූලහේතුක තර්කය ***(First Cause Argument)*** වශයෙනි.

සත්භාව තර්කය ඉදිරිපත් කිරීමට ශාන්ත ඔගස්ටීන් සහ ශාන්ත ඇන්ස්ලම් යන දාර්ශනිකයන් දෙදෙනා ම දායක වී තිබේ. මෙහි මූලික අදහස මෙසේය. දෙවියන් වහන්සේ සියලු ගුණයන්ගෙන් සමන්වාගතය. 'පැවැත්ම' යන්න ද එවන් වූ උත්කෘෂ්ඨ ගුණයකි. ඒ අනුව 'දෙවියන් වහන්සේ' යැයි කී විට 'පවතිනවා' යන්න අමුතුවෙන් කිවයුතු නොවේ. නිදසුනක් ලෙස 'ත්‍රිකෝණය' යයි කීවිට 'කෝණ



තුනක් තිබේ' යන්න කියවෙන්නා සේය. 'අන්ධයා' යැයි කීවිට 'ඇස් නොපෙනේ' යන්න කියවෙන්නා සේය. කිසියම් කෙනෙකු 'ත්‍රිකෝණයට කෝණ තුනක් නැතැයි' කිවහොත් එය ස්වයං විසංවාදී කියමනක් වේ. එනම් කියමන තුළම පරස්පරතාවක් ජනිත කරයි. එසේම 'අන්ධයාට ඇස් පෙනේ' යැයි කිවහොත් එය ද ස්වයංවිසංවාදී කියමනක් වේ. එසේම මෙම සත්භාව තර්කයෙන් කියන්නේ, 'දෙවියන් වහන්සේ' යන්න පැවැත්ම යන අභිධානයෙන් යුක්ත බැවින් 'දෙවියන් වහන්සේ' යයි කීවිට 'පවතිනවා' යන්න නිරායාසයෙන් ගම්‍ය වන බවයි. 'ත්‍රිකෝණය' යන වචනය නිශේධනය කළ විට විසංවාදයක් හටගන්නාක් මෙන් 'දෙවියන් වහන්සේ නොපවතී' යයි කීවිට ස්වයංවිසංවාදයක් හට ගන්නා බවයි, මෙයින් අවධාරණය කරන්නේ.

මෙයින් තවදුරටත් සනාථ කිරීමට උත්සාහ ගෙන තිබෙන්නේ, 'දෙවියන් වහන්සේ පවතී' යන්න විශ්ලේෂී ප්‍රස්තුතයක් බව කීමටයි. 'දෙවියන් වහන්සේ සියලුම ලක්ෂණවලින් උපලක්ෂිත නම් 'පැවැත්ම' නැමැති ලක්ෂණයෙන් ද උපලක්ෂිත විය යුතුය. එවිට උන්වහන්සේ පවතින බව විශ්ලේෂී වශයෙන් එළඹිය හැකි නිගමනයකි. උදාහරණයක් ගත හොත් 'පොහොසතා' යනු අවශ්‍යයෙන් ම සල්ලි තිබෙන තැනැත්තෙකි. දෙවියන් වහන්සේ නැත කීම පොහොසතා ලඟ සල්ලි නැත කීම මෙනි'[11] මෙය තර්ක ශාස්ත්‍රීය රීති උල්ලංඝනය වීමක් ලෙසයි, විචාරකයන් පෙන්වා දෙන්නේ. එමනිසා මෙම තර්කය මුළුමනින් ම අසාර්ථක, එමෙන් ම ප්‍රතික්ෂේප කටයුතු එකක් වන්නේ, 'දෙවියන් වහන්සේ පවතී' යන්න විශ්ලේෂී ප්‍රස්තුතයක් නොවන බව සනාථ වන නිසාය. එබැවින් සත්භාව තර්කය දෙවියන් වහන්සේගේ පැවැත්ම සනාථ කිරීමට ඉදිරිපත් වූ අසාර්ථක තර්කයක් ලෙස සැලකේ.

දෙවියන් වහන්සේගේ පැවැත්ම සනාථ කරනු වස් ඉදිරිපත් කෙරුණු තවත් තර්කයක් වන්නේ, සාධ්‍යතා තර්කයයි. මෙම තර්කයේ මූලික අර්ථය වන්නේ, සමස්තයක් ලෙස ලෝකයේත්, ඒකක වශයෙන් කුඩා ම සංසිද්ධියේත් පවත්නා ක්‍රමික බව ඉබේ හෝ ස්වාභාවිකව සිදු වන්නක් නොව, කිසියම් කාරකයකුගේ ක්‍රියාදාමයක් බව කීමයි. ඒ කාරකයා සාමාන්‍ය කෙනෙකු නොවන බවත් සර්වබලධාරී දෙවියන් ම වන බවත් මෙයින් අවධාරණය කරයි. ලෝකයේ සහ ඒකකයන්ගේ ක්‍රමික බව ඔස්සේ දෙවියන්ගේ පැවැත්ම සනාථ කිරීම සාධ්‍යතා තර්කයේ මූලික අරමුණයි.

හැම මිනිස් ක්‍රියාවක් ම හැම ස්වාභාවික සංසිද්ධියක් ම කිසියම් නිෂ්ඨාවක් අරමුණු කොට පවතී. මී මැස්සාගේ මී වදය සෑදීම, වේයාගේ වේ තුඹස නිර්මාණය, වඩු කුරුල්ලාගේ කුඩු සැකසීම කවුරුන් විසින් ඔවුන්ට ප්‍රදානය කරන ලද දැනුමක්ද? මිනිසාගේ සහ සත්ව ශරීරයේ ඉන්ද්‍රිය පද්ධතිය කෙසේ සකස් වූයේද? ඇසේ පෙනීම, කනට ශබ්ද ඇසීම, සියුම් ලෙස කල්පනා කළ විට මහ පුදුම දනවන සංසිද්ධීන්ය. සාධ්‍යතා තර්කයෙන් පෙන්වා දෙන්නේ, මේවා ස්වාභාවිකව සිදුවන දේ නොව සර්වබලධාරී දෙවියකුගේ මැදිහත් වීමෙන් සිදු වන දේ බවයි. මෙයින් තවදුරටත් පෙන්වා දෙන්නේ, මේ සියල්ලෙන් දෙවියන් පවතින බව සනාථ වන බවයි. මෙය ප්‍රබල තර්කයක් ලෙස පිළිගැනෙන නමුත් අදේවවාදී චින්තනය ගරු කරන නිදහස්වාදී දාර්ශනිකයන් කියා සිටින්නේ, මේ සියල්ල ස්වභාව ධර්මයේ නිර්මාණයන් බවයි. ස්වභාව ධර්මය හරිහැටි විශ්ලේෂණය කර ගත නොහැකි වීම නිසා එය දේවත්වයට ආරෝපණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණවාදී දේව සංකල්පය කරලියට පැමිණි බව ඔවුන්ගේ මතයයි.

මධ්‍යතන දාර්ශනික අවධියේ අවසාන භාගයේදී පමණ ශාන්ත තෝමස් ඇක්වයිනාස් විසින් ඉදිරිපත් කළ මූලහේතුක තර්කය දෙවියන් වහන්සේගේ පැවැත්ම සනාථ කිරීමට ඉදිරිපත් කළ ප්‍රබල තර්කයකි. අපට පෙනෙන, අප දකින, ලෝකය තුළ සෑම සංසිද්ධියකට ම හේතුවක් ද ඇති බව ඉතා පැහැදිළිය. එම විද්‍යමාන හේතුව ද කිසියම් දෙයක ප්‍රතිඵලයක් වන අතර එයට ද හේතුවක් තිබේ. මෙලෙස වර්තමානයේ අප දකින සෑම දෙයකට ම හේතුන් දැක්විය හැකි අතර එම සංසිද්ධීන්හි හේතුන් සොයා ආපස්සට ගමන් කළ විට අසීමිත හේතු එකිනෙකට සම්බන්ධවී පවතින බව පෙනේ. අපට එහි කෙළවරක් දැකිය නොහැකිය. සැබවින් ම මෙහි අන්තයක් හෝ කෙළවරක් හෝ මූල හේතුවක් තිබිය යුතුය. මේ අසීමිත හේතු සන්තතියේ මූලය හෙවත් මූලික හේතුව ලෙස දෙවියන් වහන්සේ ක්‍රියා කර ඇතැයි කීම මූලහේතුක තර්කයේ මුඛ්‍ය අරමුණයි. මෙය ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල්ගේ කාරක හේතු තර්කය මත පදනම්ව ගොඩනැගුණක් ලෙස විචාරකයෝ කල්පනා කරති.

මූලහේතුක තර්කය ප්‍රබල තර්කයක් ලෙස දර්ශන ඉතිහාසයෙහි මහත්සේ කතාබහට ලක්වූ නමුත් එහි පවත්නා ප්‍රධාන දූර්වලතාවය වන්නේ 'හැමදෙයට ම හේතුවක් ඇතැයි' යන මූලධර්මය පිළිගන්නා



මේ තර්කය එහි අවසාන සහ මූල හේතුව ලෙස දෙවියන් ඉදිරිපත් කළ නමුත් දෙවියන්ට හේතුවක් නැතැයි කීමයි. එනම් දෙවියන් වහන්සේ කිසියම් හේතුවක ඵලයක් නොවන බව කීමයි. එම නිසා මෙහි තාර්කික දෝෂයක් හටගනී. දෙවියන් මූලහේතුව ලෙස දැක්වීමෙන් මෙම තර්කය ඉදිරපත් කළවුන් අපේක්ෂා කරන ලද්දේ, දෙවියන්ගේ පැවැත්ම සනාථ කිරීමය. එහෙත් තර්කයේ පවත්නා දෝෂ නිසා එනම් හේතුන් රහිතව දෙවියන් පහළ වී යැයි කීම මෙන් ම දෙවියන් පවතිනවා යැයි කීම විසංවාදී බවක් ජනිත කරයි. 'සෑම දෙයකට ම හේතුවක් ඇත. එමනිසා ලෝකයට ද හේතුවක් තිබිය යුතුය. දෙවියන් වහන්සේ එම හේතුවයි. දෙවියන් වහන්සේට හේතුවක් නැත. මෙලෙස බැලූ බැල්මට ම මෙම තර්කය පරස්පර විරෝධී බව පෙනී යයි. තර්කයේ මුල් අදහස අවසාන අදහස සමග විසංවාදී වෙයි. සෑම දෙයකට ම හේතුවක් තිබේ නම් දෙවියන් වහන්සේට ද හේතුවක් තිබිය යුතුය. එම නිසා මූල හේතුක තර්කය විසංවාදී තර්කයක් ලෙස පෙනේ.[12]

මෙම ප්‍රධාන තර්ක තුනට අමතරව දෙවියන් වහන්සේගේ පැවැත්ම සනාථ කිරීම සඳහා ආගමික චින්තකයන් විසින් තවත් කරුණු දක්වා තිබේ. කෙසේ නමුත් මේ සියලු තර්ක විවිධ දූර්වලතා නිසා ප්‍රතික්ෂේප වන අතර 'දෙවියන් වහන්සේ' යන්න මෙතෙක් කිසිවකු විසින් පැහැදිලිව සනාථ කර නොමැත. එහෙත් දෙවියන් වහන්සේ පිළිබඳ සංකල්පය සහ යථෝක්ත තර්කවල පවත්නා දූර්වලතාවන් පිළිබඳව බරපතල වූ විවේචන විද්වත් ලෝකයා ඉදිරිපත් කර තිබේ. ඒ අතර සුවිශේෂී කෘතියක් ලෙස මහාචාර්ය ගුණපාල ධර්මසිරි ශූරීන් විසින් රචිත ***A Buddhist Critiqe of the Cristian Concept of God*** යන්න සඳහන් කළ හැකිය. එය තවදුරටත් අධිභෞතික සංකල්පයක් ලෙස අතීතයේදී මෙන් සමහර විට අනාගතයේදීත් අපගේ නොමද සාකච්ඡාවට බඳුන්වනු ඇත.

මෙසේ මධ්‍යතන දාර්ශනික අවධිය නව දාර්ශනික පද්ධතියක් ගොඩනැගීමට අපොහොසත්වී ඇතැයි කිව හැකි අතර ඉහත සඳහන් දෙවියන් වහන්සේගේ පැවැත්ම සනාථ කරනු වස් ඉදිරිපත් කළ තර්ක ද ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ගෙන් ණයට ගත් ඒවා බව දැක්විය හැකිය. එමනිසා දාර්ශනික වටිනාකමකින් යුත් කිසිවක් සාකච්ඡා

නොවූ, දාර්ශනික වශයෙන් අඳුරු කාලපරිච්ඡේදයක්[13] යැයි මධ්‍යතන අවධිය නම් කිරීමෙහි කිසිදු වරදක් ඇතැයි කිව නොහැකිය.

### ආන්තික සටහන්

---

1 රසල් බ'ට්‍රන්ඩ්, ***බටහිර දර්ශන ඉතිහාසය,*** ඉහත, 331 පිට.

2 කලන්සූරිය, ඒ.ඩී.පී. ***නූතන බටහිර දර්ශනය,*** දෙවන මුද්‍රණය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කොළඹ, 2007, 01 පිට.

3 ඉහත. එම 01 පිට.

4 විදානගමගේ කුලසේන, ***දාර්ශනික ගැටලු***, ඉහත, ,35 පිට.

5 කලන්සූරිය, ඒ.ඩී.පී. ***නූතන බටහිර දර්ශනය***, ඉහත, 02 පිට.

6 කලන්සූරිය. ඒ.ඩී.පී. ***දර්ශනය හැඳින්වීමක්***, ඉහත, 31-34 පිටු.

7 ඉහත එම 33 පිට.

8 "It is our duty to understand what we firmly believe, to see the rationality of our faith. Understand in order that you may believe, believe in order that you may understand. Some things we do not believe unless we understand them; others we do not understand unless we believe" Thilly, Frank, ***A History of Philosophy***, Ibid, p 148.

9 කලන්සූරිය, ඒ.ඩී.පී. ***නූතන බටහිර දර්ශනය***, ඉහත, 03 පිට.

10 ඉහත එම 03 පිට.

11 ධර්මසිරි ගුණපාල, ***දාර්ශනික ප්‍රශ්න,*** සිව්වැනි මුද්‍රණය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ, 2007, 110 පිට.

12 ඉහත, එම, 113 පිට.

13 Thilly Frank, ***A History of Philosophy***, Ibid, p 155